# දස අකුසල් හා රහමෙර පානය; විචාරාත්මක විමසුමක්

ගාල්ලේ ධම්මින්ද හිමි[1], කැලේගම ජිනරතන හිමි[2]

## හැඳින්වීම

දස අකුසල් යනු ඕනෑම බෞද්ධයෙකු ඉතා පැහැදිලිව කටපාඩමින් කීමට දක්‍ෂධර්ම කාරණා දහයකි. ත්‍රිපිටකයේ මෙම අකුසල ධර්ම දහය එනමින් හඳුන්වා ඇත්තේ සැරියුත් තෙරුන් විසින් දේශිත මජ්ඣිමනිකායික සම්මාදිට්ඨි සූත්‍රයේ පමණි. ඒවා සංඛ්‍යාත්මකව දහයක් නිසා දස අකුසල් ලෙස ව්‍යවහාර කිරීම සාවද්‍ය නොවේ.('කතමං පනාවුසො අකුසලං'... ම. නි., සම්මාදිට්ඨි සුත්ත, පි. 110)දස අකුසල් පිළිබඳ විමසීමේදීම අකුසල මූල, කුසල හා කුසල මූල පිළිබඳවද විමසීමක් කෙරේ. සම්මාදිට්ඨි සුතුරේ එන අකුසල දහය නම්;

1. පාණාතිපාතො ඛො ආවුසා අකුසලං (පරපණ නැසීම)
2. අදින්නාදානං අකුසලං (නුදුන් දේ ගැනීම)
3. කාමේසුමිච්ඡාචාරෝ අකුසලං (කාමයේ වරදවා හැසිරීම)
4. මුසාවාදො අකුසලං (බොරු කීම)
5. පිසුණාවාචො අකුසලං (කේලාම් බස් කීම)
6. ඵරුසාවාචා අකුසලං ( පරුෂ වචන කීම)
7. සම්ඵප්පලාපො අකුසලං ( ප්‍රලාප දෙඩීම)
8. අභිජ්ඣා අකුසලං (දැඩි ලෝභය)
9. ඛ්‍යාපාදො අකුසලං ( දැඩි ද්වේශය)
10. මිච්ඡාදිට්ඨි අකුසලං ( මිත්‍යා දෘෂ්ටිය)

දස අකුසලයෙන් වෙන් වීම දස කුසලය ලෙස එහිම දක්වා ඇත. දස අකුසල් පිළිබඳ සඳහන් වන අනෙක් සූත්‍ර ධර්මය වනුයේ, මජ්ඣිමනිකායේම සාලෙය්‍යක සූත්‍රයයි. මෙම සූත්‍රයේ විශේෂත්වය වන්නේ, ' දස අකුසල් ' යන හිසින් නොව ' අධර්ම චරියා, විසම චරියා ' යන විස්තරයෙන් දක්වා තිබීමයි.('අධම්මචරියා විසමචරියා'..., ම. නි. සාලෙය්‍යක සුත්ත, පි. 666)සූත්‍රයට අනුව බුදුරදුන් පැහැදිලි කරන්නේ, අධර්ම චර්යාවල විසම චර්යාවල යෙදීම කරණකොටගෙන නිරයෙහි උපදින්නට සිදුවන බවයි. ('ඒවං අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො එවම්ධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජන්ති', එම, පි. 666).එහිදී

---

[1] තාවකාලික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, dhammigalle@gmail.com
[2] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

අධර්ම චර්යා හා විසම චර්යා මොනවාදැයි විමසීමේදී කයින් කෙරෙන අධර්ම චර්යා තුනක්ද වචනයෙන් හතරක්ද මනසින් තුනක්ද වශයෙන් දක්වා ඇත.

කයින් සිදුකරන අධර්ම චර්යා 03

1. පරපණ නැසීම, 2. අදත්තාදානය, 3. කාමයේ වරදවා හැසිරීම

වචනයෙන් සිදුවන අධර්ම චර්යා 04

1. මුසාවාද බිණීම, 2. පිසුණාවාචා කීම, 3. පරොස් වචනකීම
4. ප්‍රලාප දෙඩීම

මනසින් සිදුකරන අධර්ම චර්යා 03

1. අන්සතු දෙයට ලොබ බැඳීම, 2. දැඩි ද්වේශය. 3. මිත්‍යාදෘෂ්ටිගත වීම

සූත්‍රයේ බොහෝ තැන්වල දසාකාර අධර්ම චර්යාවන්ගෙන් යුක්ත වීම අපාගාමී වීම සඳහාත් එසේ නොවී ධර්ම චර්යාවේ හා සමචර්යාවේ යෙදීම සුගතිගාමී වීමටත් හේතුවන බව දක්වා ඇත. ('එවං අධම්මචරියා විසමචරියා ... අපායං දුග්ගතිං විනිපාතං උප්පජ්ජන්ති. එවං ධම්මචරියා සමචරියා... සුග්ගතිං සග්ගං ලොකං උප්පජ්ජන්ති', එම, පි. 666-668)

දස අකුසල් පිළිබඳ සඳහන්වන අනෙක් සූත්‍රය වනුයේ, මජ්ඣිමනිකායික වේරංජක සූත්‍රයයි. (ම. නි. වේරංජක සුත්ත, බු. ජ. මු., පි. 678-683).සාලෙය්‍යක සූත්‍රයේම අනුරුවක් වැනි වේරංජක සූත්‍රයේද සඳහන් වන්නේ, උක්ත සූත්‍රය හා සබැඳි සමාන ධර්ම කාරණාවන්ය. එනිසා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම අවශ්‍ය නොවේ.

දස අකුසලධර්ම පිළිබඳ සඳහන් අනෙක් මූලාශ්‍රය වන්නේ, දීඝ නිකායික චක්කවත්ති සූත්‍රයයි. මෙහි ඇති විශේෂත්වය වන්නේ උක්ත මූලාශ්‍රයවල මෙන් පිළිවෙළටම නොවුවත් දස කාරණාවන්ම සංග්‍රහ වීමයි. එහි දක්වා ඇති පිළිවෙළට එම අකුසල කාරණා මෙසේය.

1. අදත්තාදානයල, 2. ප්‍රාණඝාතය, 3. මුසාවාදය, 4. පිසුණාවාචය, 5. කාමයේ වරදවා හැසිරීම, 6. ඵරුසාවාචය, 7. ප්‍රලාප කීම, 8. අභිජ්ඣාව 9. ව්‍යාපාදය, 10. මිත්‍යා දෘෂ්ටිය

සූත්‍රයේ අදින්නාදානයේ සිට මිත්‍යා දෘෂ්ටිය දක්වාම 'වෙපුල්ලමගමාසි' ලෙස දක්වා ඇත.(චක්කවත්ති සුත්ත, දී. නි.,පි.116). තවද මෙම කරුණු දහය අධම්ම රාගය හා විසම ලෝභය නිසා හටගන්නා බවත් එහි දැක්වේ.චක්කවත්ති සූත්‍රයේ පැනෙන විශේෂත්වය නම් රජය එනම් පාලන තන්ත්‍රය විසින් දිළින්දන්ට ධනය නොදුන් නිසා මෙම තත්ත්වය රට පුරා ව්‍යාප්ත වන බව දැක්වීමයි.

('අධනානං ධනෙ අනුප්පදියමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි, දාළිද්දියං වෙපුල්ලංගතෙ'... , එම, පි. 116).

සූත්‍රය පුරාවටම දිවෙන මුඛ්‍ය පාඨයක් නම් ''සත්ත්වයින්ගේ ආයුෂය වර්ණය පිරිහීම'' යන්නයි. අධර්ම රාගය විසම ලෝභය යනාදිය නිසාත් උක්ත දස වැදෑරුම් විසම චර්යා නිසාත් දීර්ඝආයුෂ භුක්ති විඳි සත්ත්වයන්ට සිදුවන්නේ ක්‍රමයෙන් ආයුෂයෙන් පිරිහීමට පත් වීමයි.('තයො ධම්මා වේපුල්ලමගමංසු අධම්මරාගො විසමලොභො මිච්ඡාධම්මො... ඉමෙසු ධම්මෙසු වෙපුල්ලංගතෙසු තෙසං සත්තානං ආයුපි පරිහායි වණ්ණොපි පරිහායි'., එම, පි. 118).

### ක්‍රමවේදය

මෙම පර්යේෂණය හා සබැඳි මූලාශයභාවිතය මුඛ්‍ය වශයෙන් ත්‍රිපිටක දත්ත (පෙළ)ඇසුරු කරමින් සිදුකෙරෙන අතරඅටුවා මත පිරික්සීමක් නොකෙරේ. අවශ්‍යතාව මත ද්වීතියික මූලාශය ඇසුරු කෙරේ.

### සාකච්ඡාව

උක්ත මූලාශ්‍රය දත්ත ඇසුරු කරමින්, කැටි කරමින් අප විමසන්නේ සමාජය, පුද්ගලසන්තානය, විසම චර්යාව සඳහා යොමුකරවන ප්‍රබල සාධකයක් වන 'රහමෙර පානය කිරීම' කිනම් ධර්මමය, අවස්ථාමය, සාධකමය, කාරණාවක් නිසා දස අකුසලවලින් වියුක්තව පවතීද යන්නයි.

පංචශීලය දැක්වීමේදීද පස්වන ශික්ෂා පදය ලෙස රහමෙර පානයෙන් වැලකීම දක්වා ඇත. තවද සුත්ත නිපාතික පරාභව සූත්‍රයේ පැහැදිලිවම දක්වා ඇත්තේ, පරිහානිකර කරුණු දොළහ අතර සුරාධූර්තය ද ඇතුළත් වන බවයි. එසේම සිගාල සූත්‍රයේ භෝග විනාශ මුඛ හය දැක්වීමේ දී සුරාවට ලොල් වීම ප්‍රබල කාරණයක් ලෙස දක්වා ඇත්තේ එම ලැයිස්තුවේ පළමුතැනට අන්තර්ගත කිරීමෙනි.('කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති? සුරාමේරයමජ්ජපමාදට්ඨානානුයොගො බො ගහපතිපුත්තො භොගානං අපාය මුඛං'..., සිගාල සුත්ත, දී. නි., පි. 292).භෝගයන්ගේ විනාශයට හේතු වන කාරණා වුවත් මෙම අනර්ථකාරී චර්යා, අපාය මුඛ සය (ඡ අපාය මුඛානි) ලෙස හඳුන්වා දීමේ විශේෂත්වයක් පිවති. එනම් මුඛයක් නම් යමක් ඇතුළු කිරීමත් පිට කිරීමත් යන ද්විධ ක්‍රියාවක් කළ හැකිය. එය දොරකට වුව සමානය. පළමු වන අපායෙන් එනම් රහමෙර පානය කිරීමෙන් ඇතුළු වූ පුද්ගලයෙකු අපායෙහි නිද්‍රාවට පත්වන්නේ, අලස බව පුරුදුතාවක් කරගැනීමෙනි.

එසේ වුවත් සිගාල සූත්‍රයේම එක් තැනෙක සතර කර්ම ක්ලේශ දැක්වීමේදී (අත්බව කිළිටි කරන ධර්ම) ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය හා මුසාවාදය දක්වා ඇතත් සුරාමේරය දක්වා නොමැත.('කතමස්ස චත්තාරො කම්ම කිලෙසා පහීණා හොන්ති? පණාතිපාතො ඛො ගහපතිපුත්ත කම්ම කිලෙසො, අදිනානදානං කම්ම කිලෙසො, කාමෙසු මිච්ඡාචාරෝ කම්ම කිලෙසො, මුසාවාදො කම්ම කිලෙසො', එම, පි. 290).මෙහි ඇති විවාදාත්මක කරුණ නම් එහිම තුදුස්ළාමක කරණු දැක්වීමේ ලැයිස්තුවට භෝගයන්ගේ විනාශ මුඛ සය එකු කොට තිබීමයි. ඒ අනුව තුදුස්ළාමක කර්ම වන්නේ සතර කර්ම ක්ලේශ, සතරාකාර පවුකම් හා භෝග විනාශ මුඛ හයත්ය. සූත්‍රය දක්වන්නේ මෙම තුදුස්ළාමක ධර්මවලින් විනිර්මුක්ත ආර්ය ශ්‍රාවකයා මරණින් පසු ස්වර්ගයට පැමිණෙන බවත්ය.('යතො ඛො ගහපති පුත්ත අරිය සාවකස්ස චත්තාරො කම්ම කිලෙසා පහීණා හොන්ති. චතුහි ඨානෙහි පාපකම්මං න කරොති, ඡ ච භොගානං අපාය මුඛානි න සෙවති, සො එවං චුද්දසපාපකාපගතො, ඡද්දිසාපටිච්ඡාදි, උභය ලොකෙ විජයාය පටිපන්නො හොති, තස්ස අයං චෙව ලොකො ආරද්ධා හොති පරොති ලොකො. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති'. එම, පි. 290). සම්මා දිට්ඨි, සාලෙය්‍යකාදී සූත්‍රවල අපාය හෝ සුගති ප්‍රතිසන්ධි දැක්වීමේදී සුරාමේරය නොමැති ලැයිස්තුවක් දක්වා ඇති නමුත් සිගාල සූත්‍රයේ භාවිතය ඊට හාත්පසින්ම වෙනස්ය. රහමෙර පානය කිරීම සහජ කර්ම ක්ලේශ ගණයට නොවැටේද යන්න විමසිය යුතුය. එනමුත් සිලගාල සූත්‍රගත භාවිතය එම අදහස් වෙනත් දිශාවකට නැවත මෙහෙයවනු ඇත.

## නිගමනය

අප නිගමනයට අනුව නම්, සුරාමේරයට අදාළපාප චර්යාව හුදෙක් පුද්ගලයෙකුගේ වර්තමානතත්ත්වය නියෝජනය කරනු ලබන චර්යාවකි. ඒ බැව් මජ්ජපානයට අදාළ ආදීනව විමසීමෙන් සනාත කරගත හැකිය. එහි දොස් හයකි.

1. මෙලොවදීම ධනය විනාශ වීම
2. කලහ වැඩි වීම
3. රෝගවලට කෙතක් විම
4. අපකීර්තිය ඉපදීම
5. කයෙහි වැසුණු තැන් විවෘතකොට හැසිරීම
6. නුවණ දුර්වල කිරීම(එම, පි. 293)

එසේම පරාභව සූත්‍රයේ අටවන පරිහානිකර කාරණය ලෙස සුරාවට ලොල් වීම දක්වා ඇත.('.... සුරාධුත්තො අක්ඛධුත්තො ච යො නරො ලද්ධං ලද්ධං

විනාසෙති තං පරාභවතො මුඛං ඉති හෙතං විජානාම අට්ඨමො සො පරාභවො....', පරාභව සුත්ත, සු. නි., පි. 34)පිරිහීම වර්තමාන (පච්චුප්පන්න) කාලයට අයත් වන අතර පරිහානිකර කාරණාවල ශේෂ කර්මධාරාවට එක්නොවනවා යැයි පැවසිය නොහැක. එසේ වුවත් මෙහි දැක්වෙන 'ලද්ධං ලද්ධං විනාසේති' එනම් ලැබෙන ලැබෙන දෑ විනාශ කිරීම යන අනුත්ප්‍රාසමය භාෂා භාවිතය සිගාල සූත්‍රාගත මජ්ජපාන ආදීනව තව තවත් විසද කරයි. තවද සුත්ත නිපාත ධම්මික සූත්‍රයේ දැක්වෙන පරිදි රහමෙර පානය 'අපුඤ්ඤායතන' එනම් පාපී ආයතනයක් සිහිගන්වයි. පාපය පිනෙහි විරුද්ධ භාවිතය නිසා අකුසල් හෝ කුසල් එම මාර්ගයේම ගමන් කළා වුවත්, සංකල්පීය වශයෙන් වෙනස්වන නිසා රහමෙර පානය අකුසල ගණයට වඩා පාපී මාවතට වඩාත් සමීපය.

ප්‍රමුඛ පද : දස අකුසල්, රහමෙර පානය, අපුඤ්ඤායතන, අධම්මචරියා

ආශ්‍රිත ග්‍රන්ථ

*ම.නි. සම්මාදිට්ඨි සුත්ත*,බු. ජ. මු.,(පුනර්) 2006

*ම.නි., සාලෙය්‍යක සුත්ත*, බු. ජ. මු. (පුනර්) 2006

*දී.නි., සිගාල සුත්ත*, බු. ජ. මු., (පුනර්) 2006

චන්ද්‍රවිමල හිමි, රේරුකානේ. (2014).*ධර්ම විනිශ්චය*, පොකුණුවිට. ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය.

ඥානසීහ හිමි, හේන්පිටගෙදර.(1996).*බෞද්ධ දර්ශනය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.